# යුක්රේන යුද්ධය සහ අප්‍රිකාවේ අනාගතය




Image-africacenter.org

2022 පෙබරවාරි 24 වන දින පුටින් විසින් ආරම්භ කල යුක්රේන ආක්‍රමණය දෙවන ලෝක යුද සමයෙන් පසු යුරෝපයේ ඇතිවූ වඩාත් ආක්‍රමණශීලී ක්‍රියාවක් ලෙස සැලකේ. ලොව ප්‍රදානතම තිරිඟු නිශ්පාදකයෙක් වන යුක්රේනය යුද්ධයකට මුහුන දීම බොහෝ රටවල ආහාර සුරක්ෂිතතාවය කෙරෙහිද අහිතකර බලපෑම් එල්ල කර ඇත.

යුද්ධය ඇරඹීමත් සමග යුරෝපය බලශක්ති අර්බුධයකට මුහුන දෙන අප්‍රිකානු කලාපය ආහාර සම්බන්ධයෙන් ගැටලුකාරී තත්වයකට මුහුණදී ඇත. 2007 -2019 කාල වකවානුව තුල අප්‍රිකානු කලාපයේ තිරිඟු ආනයනය 68% කින් වර්ධනය වූ අතර බටහිර රටවල් රුසියාවට සම්බාධක පැනවීමත් සමග ඇතිවූ පොහොර හිගයෙන් කෘශිකාර්මික නිශ්පාදන ද අඩු වී ආහාර වල මිල ඉහල යාමද සිදුව ඇත.රුසියාව සහ අප්‍රිකාව අතර වෙලදාම වැඩි වශයෙන් සිදුවන කලු මුහුද වැනි වරායන් වැසී යාම නිසා අප්‍රිකානු කලාපයේ ඉන්ධන මිල ඉහල යාමටද එය බලපා ඇත

යුක්රේන යුද්ධය ආරම්භයට පෙර සිටම දේශපාලන වශයෙන් රුසියාව අප්‍රිකානු කලාපය තුල සිය භූ දේශපාලන බලපෑම වැඩි කිරීමට විවිධ ක්‍රියාත්මක අනුගමනය කර ඇත. 1991දී සෝවියට් සංගමය බිද වැටුනු පසු 2006 පමණ සිට පුටින් අප්‍රිකාව තුල රුසියානු බලය පැතිරවීමට කටයුතු කර ඇත. 2015-2019 කාලය තුල රුසියාව අප්‍රිකානු රාජ්‍යයන් සමග මිලිටරි සහයෝගීතා ගිවිසුම් 19ක් අත්සන් කර ඇති අතර රුසියානු ආයුධ අලෙවිය කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කර ඇත. අප්‍රිකාව තුල රුසියානු බලපෑම ක්‍රියාත්මක වන ආකාරයක් ලෙස PMC නම් පුටින්ගේ පුද්ගලික ආරක්ශක බට කණ්ඩායම් හැදින්විය හැකිය. දුර්වල ආණ්ඩු සහ ස්වභාවික සම්පත්වල බහුලත්වය නිසා අප්‍රිකාව තුල සන්නද්ද කණ්ඩායම් සදහා සටන්බිමක් වී ඇත. එමනිසා බොහෝ රාජ්‍යයන් ආරක්ශක කටයුතු සදහා PMC සහය ලබාගැනීමට පෙලඹී ඇත. ඒ සදහා වැටුප් ලෙස ස්වභාවික සම්පත් සූරාකෑමෙන් ලැබෙන මුදල් PMC වෙත ගෙවනු ලබයි.

මෙම කණ්ඩායම් බොහෝ විට අප්‍රිකාව තුල සිටින ඇමෙරිකානු හමුදා සමග ගැටුම් සදහා ද යොදා ගැනෙන අතර රුසියානු ඔත්තු සේවා සදහා බුද්ධි මූලාශ්‍රයක් ලෙසද යොදා ගැනේ.

චීනය ද අප්‍රිකානු කලාපය සිය ආර්ථික කටයුතු සදහා යොදා ගන්නා නිසා අප්‍රිකාව තුල චීන රුසියන් ක්‍රියාකාරකම් අප්‍රිකාව තුල  බටහිර ආධිපත්‍යය දුර්වල වීමට ද හේතු වී තිබේ. අප්‍රිකාව තුල තවමත් ප්‍රංශ හමුදා ක්‍රියාත්මක අතර ඔවුන් පැරණි යටත් විජිත  තුල ඇති ස්වභාවික සම්පත් සිය ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් යොදාගනී.
අප්‍රිකාවේ අනාගතය කෙරෙහි රුසියානු යුක්රේන යුද්ධයේ අවසන් ප්‍රතිඵලය මෙන්ම එයින් පසුව බිහිවන නව ලෝක බලවතුන් ද බලපාන බව අවසාන වශයෙන් කිව හැකිය.